

# IWAY (අයි වේ)

## ප්‍රමිතිය

මෙම ලේඛනය IWAY සම්මත සාමාන්‍ය අංශයේ (Standard General Section)පරිවර්තනයකි, සංස්කරණය 6.0. මේ පරිවර්තනය තොරතුරු ලබා ගැනීමේ අරමුණ සඳහා පමණක් වන අතර ගිවිසුම්කර ලේඛනයක් ලෙස දිස් විය නොහැකිය. එකම නිල ලේඛනය වන්නේ ඉංග්‍රීසි අනුවාදය පමණක් වන අතර භාෂණ පරිවර්තනයේදී, ආරවුල් සහ වෙනත් එකඟ නොවීම් වල ඇති වන වෙනස්කම් වලදී යොමු විය යුතු ලේඛනය වේ.

***නිෂ්පාදන, සේවා, අමුද්‍රව්‍ය සහ සංරචක වගකීමෙන් සම්පාදනය කිරීමේ IKEA (අයිකියා) ක්‍රමය***

IWAY (අයි වේ) ප්‍රමිතිය 6.0 සංස්කරණ 2019 සැප්තැම්බර් ප්‍රකාශිත Inter IKEA Sysytems B.V.2019 (ඉන්ටර් අයිකියා සිස්ටම්ස් බී.වී.2019)



# පටුන


**හැඳින්වීම** පි. 3

**IWAY (අයි වේ) ප්‍රතිපත්ති** 9 පි.

**පොදු අංශය** 10 පි.

*(සියලු සැපයුම් කරුවන් සඳහා වූ අවශ්‍යතා)*

**අතිරේක අංශ**

*(සැපයුම් කරුවන් සඳහා සුවිශේෂ වූ අවශ්‍යතා වෙන් වෙන් ලේඛන වල තිබේ)*

- නවාතැන් පහසුකම් අංශය
- සත්ත්ව සුබසාධන අංශය
- වනවිද්‍යා අංශය
- ප්‍රවාහන අංශය





# IKEA (අයිකියා) දැක්ම බොහෝ ජනතාව උදෙසා වඩා යහපත් එදිනෙදා ජීවිතයක් නිර්මාණය කිරීමයි

**මෙම ලේඛනයේ අරමුණ සඳහා "අපි" යනුවෙන් අදහස් වන්නේ, IKEA (අයිකියා) සන්නාමය යටතේ මෙහෙයවෙනු ලබන සෑම සමාගමක් ම වන අතර, "ඔබ" යනුවෙන් අදහස් වන්නේ ඕනෑම IKEA (අයිකියා) සමාගමකට සැපයුම්කරුවෙකු වන ඕනෑම සපයන්නෙකුට ය.**

**අප දැක්ම බෙදා ගන්නා සැපයුම්කරුවන්, සේවා සපයන්නන් සහ වෙනත් පාර්ශව (මෙතැන් සිට, "සැපයුම්කරුවන්") සමඟ දිගු කාලීන සබඳතා ගොඩ නඟා ගැනීමට අපට ("IKEA"["අයිකියා"]) වුවමනා ය. නිෂ්පාදන, සේවා, අමුද්‍රව්‍ය සහ සංරචක වගකීමෙන් සම්පාදනය කිරීමේ IKEA (අයිකියා) ක්‍රමය හෙවත් IWAY (අයි වේ) අප විසින් සංවර්ධනය කර තිබෙන්නේ එබැවිනි.**

IKEA (අයිකියා) *අගය දාමයතුළ සැපයුම්කරුවෙකු* වශයෙන් මිනිසුන්, ලෝකය සහ සතුන් රැක බලා ගැනීමේ දී අප ඔබෙන් අපේක්ෂා කරනු ලබන දේ IWAY (අයි වේ) අර්ථදක්වයි.

මිනිසුන්ට, ලෝකයට සහ සතුන්ට ගෞරවයෙන් යුතුව සලකනු ලබන බව, සේවකයින් වඩා ඵලදායී ලෙස සේවය කරන බව, සම්පත් වඩා කාර්යක්ෂම ලෙස උපයෝගී කරගන්නා බව සහ ව්‍යාපාරය දියුණු වන බව IWAY (අයි වේ) සමඟ වැඩ කිරීමේ දී අප අත්දැකීම අපට පෙන්වා දී තිබෙනවා. IKEA (අයිකියා) විකුණන සෑම භාණ්ඩයක්ම වගකීමෙන් යුතුව නිෂ්පාදනය, ප්‍රවාහනය, භාරදීම සහ එකලස් කිරීම සිදුකරන බව සහ අප වෙළඳසැල් වලසැපයුම්කරුවන්, පාරිභෝගික සම්බන්ධීස්ථාන සහ නිෂ්පාදන භූමි යහපත් සමාජ, පාරිසරික සහ සත්ත්ව සුබසාධන තත්ත්ව පවත්වා ගන්නා බව දැන ගැනීමෙන් - අප පාරිභෝකයින් ද ප්‍රතිලාභ ලබයි.

IWAY (අයි වේ) සමඟ වැඩ කිරීමේ දී, පහත ප්‍රශ්න මඟින් අපට අඛණ්ඩව මඟ පෙන්වනු ලැබේ:












# IKEA (අයිකියා) අගය දාමයේ සෑම පියවරක් පාසා ම වගකීමෙන් යුතු ප්‍රතිසම්පාදන ප්‍රතිපත්ති සඳහා අනුග්‍රහ දැක්වීමට අප අධිෂ්ඨාන කර සිටිමු

IWAY (අයි වේ) ඉටු කිරීමට කැප වීම මඟින්, පහත දෑ තහවුරු කිරීම ඔබෙන් අපේක්ෂා කෙරේ:

**වගකීම**

ප්‍රාදේශීය, දේශීය සහ ජාත්‍යන්තර නීති මෙන්ම IWAY (අයි වේ) ප්‍රමිතිය තුළ අර්ථදක්වා ඇති IWAY (අයි වේ) “කළ යුතු” සහ IWAY (අයි වේ) “මූලික” අවශ්‍යතාවන්ට සෑම විටම අනුගතවීමට ඔබ වගකීමෙන් සිටියි..

**විවෘතභාවය**

වැඩිදියුණුව අවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ ඔබ විවෘතභාවයෙන් සහ අවංකභාවයෙන් යුක්ත වෙයි.

**අඛණ්ඩ වැඩිදියුණුව**

IWAY (අයි වේ) ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාලය සහ වෙහෙස අප හඳුනාගන්නා අතර ක්‍රියාකාරීත්වය සවිබලගැන්වීමට සහ අවශ්‍ය පරිදි IWAY (අයි වේ) “මූලික” අවශ්‍යතාවන්ගෙන් ඔබ්බට ගමන් කිරීමට අඛණ්ඩ උන්නතිගාමී මනසක් පවත්වා ගැනීමට අපි ඔබව දිරිමත් කරන්නෙමු.



# අප ක්‍රියා ද වෙනසක් ඇති කරන බව අපි හඳුනාගන්නෙමු

අප ඔබ සමඟ වැඩ කරන ආකාරය පිළිබඳ සාධාරණ සහ විවෘත එළඹුමක් ලබා ගැනීමට අපි වෙහෙසෙන්නෙමු. මින් අදහස් වන්නේ:

**පෙළ ගැස්ම**

ඔබෙන් අප ඉල්ලා සිටින එම අපේක්ෂණම ඉටු කරගැනීම වෙනුවෙන් අභ්‍යන්තර වශයෙන් කටයුතු කිරීමට අපි අරමුණු කරන්නෙමු.

**සංවාදය**

අපි අපේ සියලුම සැපයුම්කරුවන් සමඟ විවෘත සන්නිවේදන මාර්ග පවත්වා ගන්නා අතර අප ක්‍රියාකාරීත්වය සහ හැසිරීම පිළිබඳ ඔබ සතු ඕනෑම ප්‍රතිචාරයක් අපි සාදරයෙන් පිළිගනිමු.

**සහයෝගය**

ඔබට IWAY (අයි වේ) ප්‍රමිතියට අනුගත වෙමින් එය ඉටුකිරීමට සහ අඛණ්ඩව සංවර්ධනය වීමට ඔබට ශක්තිය ලබා දීමට හැකි තැන් වල දී, අපි ඔබේ ක්‍රියාවලීන් දියුණු කරගැනීමට උපකාරීවීමට, ඔබේ මෙහෙයුම් වලට අනුවර්තනය වූ ප්‍රායෝගික සහයෝගය සපයන්නෙමු.



# IWAY (අයි වේ) ප්‍රතිපත්ති සහ අවශ්‍යතා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහ ප්‍රතිපත්ති මත පදනම් වේ

මේවා ව්‍යාපාර සහ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශන මූලධර්ම (UNGPs) වෙත අපේ කැපවීම පිළිබිඹු කරන අතර එක්සත් ජාතීන්ගේ ගෝලීය සංහිතාවෙහි මූලධර්ම දහය මත පදනම් වේ. අප අවශ්‍යතා විකාශනය කිරීමේ දී, සෙසු දේ අතරින් අපට එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සහ රැකියාවේ අනාගතය සඳහා වූ ලෝක කම්කරු සංවිධානයේ සියවස් ප්‍රකාශය මගින්ද මාර්ගෝපදේශනය ලැබුණි.

IWAY (අයි වේ) ව්‍යුහ ගත වී ඇත්තේ:

**ප්‍රතිපත්ති**

නිෂ්පාදන, සේවා, අමුද්‍රව්‍ය සහ සංරචක වගකීමෙන් යුතුව සම්පාදනය කිරීමේ IKEA (අයිකියා) ස්ථාවරය, ප්‍රතිපත්ති අර්ථදක්වයි.

**අංශ**

IWAY (අයි වේ) අවශ්‍යතා කාණ්ඩ අංශ සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් හෝ සැලසුම් අනුව අදාළ වේ.

## IWAY (අයි වේ) අවශ්‍යතා

**කළ යුතු (MUST)**

ව්‍යාපාර කිරීමේදී සෑම අවස්ථාවක දී ම ඉටුවිය යුතු අවශ්‍යතා.

**මූලික (BASIC)**

පළමුව සේවය ලබාදීමෙන් මාස 12ක් ඇතුළත දී ඉටු විය යුතු අවශ්‍යතා.

**උසස් (ADVANCED)**

අවම අනුකූලතාවයෙන් ඔබ්බට ගමන් කරන සහ වඩා තිරසර භාවිතයන් වෙත වූ අතිරේක පියවර අර්ථදක්වන අවශ්‍යතා.
අදාළ IKEA(අයිකියා) කාර්ය මණ්ඩලය මගින් නියම කර ගන්නා ප්‍රමුඛතා අනුව මේවා අදාළ හෝ අදාළ නොවිය හැකිය.

**අනර්ඝ (EXCELLENT)**

අවම අනුකූලතාවයෙන් ඔබ්බට ගමන් කරන සහ වඩා තිරසර භාවිතයන් වෙත වූ අතිරේක පියවර අර්ථදක්වන අවශ්‍යතා.
අදාළ IKEA(අයිකියා) කාර්ය මණ්ඩලය මගින් නියම කර ගන්නා ප්‍රමුඛතා අනුව මේවා අදාළ හෝ අදාළ නොවිය හැකිය.

ඉටු විය යුතුම අවශ්‍යතා, නෛතික වුවත් IWAY (අයි වේ) අවශ්‍යතා වුවත් ඒවා සැමවිටම පිළිපැදිය යුතු වේ. IWAY (අයි වේ) අවශ්‍යතා අදාළ නීති හා රෙගුලාසි සමඟ පරස්පර වේ නම්, නීතිය පිළිපැදේ සහ පැවතේ. එවැනි අවස්ථා වල දී, වහාම IKEA(අයිකියා) දැනුවත් කෙරෙනු ලබන අතර IWAY (අයි වේ) අවශ්‍යතාවයට ගරු කළ හැකි විකල්ප මාර්ග සොයනු ලැබේ.

**සේවය කරන ආකාර සහ අවශ්‍යතාවන්හි සුසංයෝගයෙන් යුතුව ක්‍රියා කිරීමට ප්‍රයත්න දැරීම් අපි දිරිමත් කරන්නෙමු**

සැපයුම්කරුවන්ට ඔවුන්ගේම චර්යාධර්ම සංග්‍රහයක්, වෙනත් ගැනුම්කරුවෙකුගේ චර්යාධර්ම සංග්‍රහයක් අනුව වැඩ කිරීමට හෝ IWAY (අයි වේ) හා සංසන්දනාත්මක වූ තිරසර වැඩසටහනකට අනුකූලව සහතිකකරනු ලැබීමට සිදුවිය හැකි බව IKEA(අයිකියා) හඳුනාගනී. IWAY (අයි වේ) අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමේ විකල්ප එළඹුම් සඳහා IKEA (අයිකියා) සහයෝගය දක්වයි. එවැනි එළඹුම් සමානදැයි තීරණය කිරීමේ අයිතිය IKEA(අයිකියා) වෙත නියම වේ.

**IWAY (අයි වේ) සාර්ථකව ක්‍රියාවට නැංවීම රඳා පවතින්නේ සමූපකාරය, අන්‍යෝන්‍ය විශ්වාසය සහ ගරු කිරීම මතය**

ඔබෙන් ලබාගත්සියලු නිරීක්ෂණ, සාකච්ඡා සහ තොරතුරු IKEA,(අයිකියා), එහි සම සේවකයින් සහ IKEA(අයිකියා) විසින් පත් කරනු ලබන ඕනෑම තෙවන පාර්ශව සංවිධාන විසින් රහසිගතව සලකනු ලැබේ. IWAY (අයි වේ) සම්බන්ධයෙන් රැස් කෙරුණු ඕනෑම දත්තයක් ගරුත්වයෙන් යුතුව සහ IWAY (අයි වේ) හා අනුකූලතාවය තහවුරු කරගැනීමේ පරම අරමුණ සඳහාම සලකනු ලබයි.

**IWAY (අයි වේ) ප්‍රමිතියේ නිල භාෂාව ඉංග්‍රීසි වේ**

IWAY (අයි වේ) ප්‍රමිතියේ පරිවර්තන සපයනු ලබන්නේ තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණක් වන අතර ඒ කෙරෙහි ගිවිසුම් සහගත ලේඛන ලෙස විශ්වාසය තැබිය නොහැකි ය. ඉංග්‍රීසි අනුවාදය එකම ගිවිසුම්සහගත ලේඛනය වන අතර ව්‍යාකූල හෝ අසංගත අවස්ථාවන්දීහි දී එය බල පැවැත්වේ.

**ශබ්දමාලාව**

ඇල අකුරු සහිත වචන ශබ්දමාලාව තුළ අර්ථදක්වා ඇත.



# IWAY (අයි වේ) ප්‍රතිපත්ති

## 1

**IWAY (අයි වේ)** ප්‍රතිපත්ති කාර්යක්ෂම දිනචර්යා සහ විවෘත සංවාදය මඟින් අනුබල ලබයි

## 2

ව්‍යාපාරය නීත්‍යානුකූලව සහ අවංකව මෙහෙයවනු ලැබේ

## 3

ළමුන් සුරක්ෂිත කරනු ලබන අතර රැකියා සහ අධ්‍යයනය සඳහා අවස්ථා සහ පවුල් ජීවිතය සඳහා අනුග්‍රහ දක්වනු ලැබේ

## 4

මූලික ශ්‍රම අයිතිවාසිකම් වලට ගරු කෙරෙනු ලැබේ

## 5

සේවකයින්ටවිවේක කාල, වගකීමෙන් යුතු ගෙවීම් සහ නිපුණතාවය සංවර්ධනය කර ගැනීමට අවස්ථා ඇත

## 6

සේවකයින්ගේසෞඛ්‍යය සහ සුරක්ෂිතභාවය සුරැකේ

## 7

රැකියා සහ ජීවන තත්ත්ව යෝග්‍ය වේ

## 8

ලෝකය සුරැකේ

## 9

ජලය සහ අපද්‍රව්‍ය ඇතුළු සම්පත් තිරසර සහ චක්‍රීය ආකාරයකින් කළමනාකරණය කරනු ලැබේ

## 10

සතුන් ශිෂ්ටසම්පන්න ජීවිත ගත කරයි



# IWAY (අයි වේ) ප්‍රමිතිය

# පොදු අංශය

*සියලු සැපයුම් කරුවන් සඳහා අවශ්‍යතා*

මෙම ලේඛනය IWAY සම්මත සාමාන්‍ය අංශයේ (Standard General Section) පරිවර්තනයකි, සංස්කරණය 6.0. මේ පරිවර්තනය තොරතුරු ලබා ගැනීමේ අරමුණ සඳහා පමණක් වන අතර ගිවිසුම්කර ලේඛනයක් ලෙස දිස් විය නොහැකිය. එකම නිල ලේඛනය වන්නේ ඉංග්‍රීසි අනුවාදය පමණක් වන අතර භාෂණ පරිවර්තනයේදී, ආරවුල් සහ වෙනත් එකඟ නොවීම් වල ඇති වන වෙනස්කම් වලදී යොමු විය යුතු ලේඛනය වේ.

**6.0 සංස්කරණය 2019 සැප්තැම්බර් ප්‍රකාශිත - © Inter IKEA Systems B.V. 2019**

**(ඉන්ටර් අයිකියා සිස්ටම්ස් බී.වී.2019)**

# 1 IWAY (අයිවේ) ප්‍රතිපත්ති අනුබල ලබන්නේ කාර්යක්ෂම දිනචර්යා සහ විවෘත සංවාදය මඟිනි

**ක්‍රියාකාරීත්ව කළමනාකරණය**

**මූලික (BASIC)**

G 1.1 IWAY (අයි වේ) සම්බන්ධ වගවීම සහ වගකීම කළමනාකරන මට්ටම් එකක හෝ ඊට වැඩි නියෝජිත පිරිසකට පවරා තිබේ.

G 1.2 IWAY (අයි වේ) අවශ්‍යතාවන්ට පවතින අනුකූලතාවය ඇගයීමට අවම වශයෙන් සෑම මාස 12කට වරක් අභ්‍යන්තර විගණන පැවැත්වේ.

**උසස් (ADVANCED)**

G 1.3 IWAY (අයි වේ) ආවරණය කරන ලිඛිත ක්‍රියාමාර්ග සහ දින චර්යා සුදුසු ලෙස තිබේ.

G 1.4 IWAY (අයි වේ) සම්බන්ධ ක්‍රියාකාරීත්වය මැනීමට සහ වැඩි දියුණුකිරීමට දර්ශක සහ සැලසුම් සුදුසු ලෙස තිබේ.

**සැපයුම් දාමය කළමනාකරණය**

**මූලික (BASIC)**

G 1.5 *IKEA(අයිකියා) අගය දාමය තුළ* නිෂ්පාදන, සේවා, අමුද්‍රව්‍ය හෝ සංරචකයන්හි උප-ගිවිසුම්කරුවන් *IKEA(අයිකියා)* සංවිධාන විශේෂීකරණයන්ට අනුගත වන පරිදි සිතියම් ගත කර ඇත.

G 1.6 IKEA (අයිකියා) සංවිධාන විශේෂීකරණයන්ට අනුගතව IKEA(අයිකියා) *අගය දාමය තුළ උප ගිවිසුම්කරුවන්වෙත* නිෂ්පාදන, සේවා, අමුද්‍රව්‍ය හෝ සංරචකයන් IWAY (අයි වේ) ක්‍රියාවට නැංවීම සහ තහවුරු කරගැනීම සිදුකරයි.

**අනර්ඝ (EXCELLENT)**

G 1.7 IKEA (අයිකියා) *අගය දාමයේ* සමාජ සහ පාරිසරික අවදානම් හඳුනාගෙන ඒවා අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ.

## සේවක/කළමනාකරණ සංවාදය

**මූලික (BASIC)**

G 1.8 *IWAY (අයි වේ)* සම්බන්ධ තම අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ සේවකයින්ව දැනුවත් කර තිබේ.

G 1.9 IWAY (අයි වේ) හා සම්බන්ධ සේවකයින් සමඟ සැලසුම්ගත සංවාදයක් පවතී..



# 2 ව්‍යාපාර නීත්‍යානුකූලව සහ අවංකව මෙහෙයවනු ලැබේ

*ව්‍යාපාර ආචාරධර්ම*

**කළ යුතු (MUST)**

G 2.1 IKEA(අයිකියා) ව්‍යාපාරය හා සම්බන්ධ විශ්වාසය සහ විනිවිදභාවය සහතික කර ඇත. නීතිය බිඳීමට, ලේඛන ව්‍යාජනය කිරීමට, රැවටීමට, හෝ දූෂණ සිදු කිරීමට දරන ප්‍රයත්න පිළිගැනීමට ලක් නොවේ.

**මූලික (BASIC)**

G 2.2 IWAY (අයි වේ) හා සම්බන්ධ අදාළ සියලු නීති, රෙගුලාසි සහ අවසර පත්‍ර අනුකූල වූ ඒවා වේ.

# 3 ළමුන් සුරක්ෂිත කරනු ලබන අතර රැකියා සහ අධ්‍යයනය සඳහා අවස්ථා සහ පවුල් ජීවිතය සඳහා අනුග්‍රහ දක්වනු ලැබේ

**ළමුන් සුරැකීම**

කළ යුතු (MUST)

G 3.1 ළමා ශ්‍රමය නැත. ළමා ශ්‍රමය පිළිබඳ විභවතාවයෙන් යුත් හෝ තහවුරු වූ සිද්ධි තිබේ නම් වහාම IKEA(අයිකියා) වෙත වාර්තා කළ යුතු ය.

මූලික (BASIC)

G 3.2 වැඩ කිරීමේ අවම නෛතික වයසට වඩා අඩු ළමයින් වැඩෙහි නොයෙදෙයි. වෘත්තීය අභ්‍යාසලාභීන්ට වයස අවුරුදු 14 සිට පුහුණුවට සහභාගී විය හැකි ය. පුහුණුව ඔවුන්ගේ අධ්‍යාපනයට අදාළ වේ.

G 3.3 ළමයි ,යොවුන් සේවකයින් ලෙස හෝ වෘත්තීය අභ්‍යාසලාභීන් ලෙස හෝ, උවදුරු සහිත වැඩහෝ රාත්‍රී කාලයේ වැඩ වල නොයෙදෙයි.

**රැකියා සහ අධ්‍යයනය සඳහා අවස්ථා**

මූලික (BASIC)

G 3.4 යොවුන් සේවකයින් සඳහා රැකියා අවස්ථා හඳුනාගෙන ප්‍රවර්ධනය කරනු ලැබේ.

උසස් (ADVANCED)

G 3.5 ළමයින් සඳහා වෘත්තීය පුහුණු අවස්ථා හඳුනාගෙන ප්‍රවර්ධනය කරනු ලැබේ.

## පවුල් ජීවිතය සඳහා අවස්ථා

උසස් (ADVANCED)

G 3.6 සේවකයින්ට අදාළ ව්‍යවස්ථා සම්පාදනය මඟින් අර්ථදක්වා ඇති දෙයට අමතරව ළමා සුරැකුම් උපකාරය ලැබේ.



# 4 මූලික ශ්‍රම අයිතිවාසිකම් වලට ගරු කෙරෙනු ලැබේ

**සේවක නිදහස**

**කළ යුතු (MUST)**

G 4.1 බල කළ, ඇප වුණු හෝ බන්ධනාගාර ශ්‍රමය නැත . බල කළ, ඇප වුණු හෝ බන්ධනාගාර ශ්‍රමය සම්බන්ධ විභාවතාවයෙන් යුතු හෝ තහවුරු වූ සිද්ධියක් වේ නම් එය IKEA(අයිකියා) වෙත වහාම වාර්තා කළ යුතු ය.

**මූලික (BASIC)**

G 4.2 අතිකාල සේවය ස්වේච්ඡාවෙන් කරනු ලබන දෙයක් වන අතර අතිකාල සේවය ප්‍රතික්ෂේප කරන සේවකයින්ට දඬුවම් කරනු නොලැබේ. අදාළ ව්‍යවස්ථා සම්පාදනය මඟින් මැනවින් අර්ථදක්වා ඇති නිශ්චිත අවස්ථා යටතේ, අදාළ තැන්හි දී, සේවක නියෝජනය හරහා එකඟ වී ඇත්නම්, අතිකාල සේවය කෙටි කාලයක් සඳහා අනිවාර්ය විය හැකිය..

**රැස්වීමේ සහ ශෝකවීමේ නිදහස**

**මූලික (BASIC)**

G 4.3 සේවකයින්ට ඔවුන්ගේ සේවා සම්බන්ධ සංවිධාන පිහිටුවීමට හෝ ඒවාට සහභාගී වීමට (හෝ නොවීමට) එමෙන්ම සාමූහික කේවල් කිරීමෙ ෟ යෙදීමට ඇති තම අයිතිවාසිකම භාවිතා කිරීමට නිදහස ඇත. මේ අයිතිවාසිකම් භාවිතා කරනු ලබන්නේ ශාරීරිකව හෝ මානසිකව වෙනස්කොට සලකනු ලැබීම, ප්‍රචණ්ඩත්වය හෝ හිංසනය පිළිබඳ බියෙන් තොරව ය.

G 4.4 පළිගැනීමට ලක් වීමෙන් තොරව පැමිණිලි හෝ සැලකිල්ලට ලක් විය යුතු කරුණු මතු කිරීමට සේවකයින් දැනුවත් වූ දුක් ගැනවිලි යාන්ත්‍රණයක් සුදුසු ලෙස පවතියි. පැමිණිලි පටිගත කරනු ලබා ඒ අනුව ක්‍රියාමාර්ග ගනු ලබන අතර සේවකයින්ගේ නිර්නාමිකභාවය ආරක්ෂා කරනු ලැබේ.

## සේවයට බඳවා ගැනීමේ සහ රැකියා නියුක්ති භාවිතයන්

**මූලික (BASIC)**

G 4.5 සේවයට බඳවා ගැනීමේ, රැකියා නියුක්තියේ හෝ අවසන් කිරීමේ ක්‍රියාවලි සඳහා වැය වන ගාස්තු සහ වියදම් සේවකයින් මත නොපැවරේ. තැන්පතු ලබාදීමට සේවකයින්ගෙන් ඉල්ලුම් නොකෙරේ.

G 4.6 සේවයට බඳවා ගැනීම සම්බන්ධ ලිඛිත පිළිවෙතක් ක්‍රියාවට නංවා ඇති අතර, වයස් සත්‍යාපනය, තිරගත කිරීම සහ අයදුම්කරුවන් තෝරාගැනීම සහ සියලු ශ්‍රම බඳවා ගැනීම් පිළිබඳ භාවිතය සම්බන්ධයෙන් නීති එයට ඇතුළත් වේ.

G 4.7 සේවකයින් සේවය ඇරඹීමට හෝ ප්‍රාරම්භක පුහුණුව ලැබීමට හෝ මේ දෙකෙන් පළමුව කිරීමට සිදුවන දෙයට පෙර ලිඛිත ගිවිසුමක් හෝ එයට සමාන දෙයකට අත්සන් තබයි. අත්සන් කිරීමට පෙර සේවකයින්ට ගිවිසුමේ පිටපතක් සහ එහි කොන්දේසි අවබෝධකරගැනීමට ලැබේ. රැකියා නියුක්ති කොන්දේසි සම්බන්ධ සැළකිය යුතු වෙනස්කම් සම්බන්ධයෙන් සේවකයා විසින් ලිඛිතව එකඟ වනු ලැබෙයි.

G 4.8 ශුන්‍ය හෝරා ගිවිසුම්් භාවිතා නොකෙරේ.

G 4.9 වෙනස්කොට සලකනු ලැබීම ,හිංසනය, ව්‍යාපාර ආචාරධර්ම, විනය ක්‍රියාමාර්ග සහ මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් නීති ලියා ක්‍රියාවට නංවා සේවකයින් වෙත සන්නිවේදනය කර ඇත.

G 4.10 විනය මිනුම් වලට ශාරීරික දඬුවම්, ප්‍රචණ්ඩකාරී තර්ජන, ප්‍රසිද්ධියේ අනතුරු ඇඟවීම් හෝ දඬුවම් පැමිණවීම්, දඩ සහ ගිවිසුම්කර ප්‍රතිලාභ ඉවත් කිරීම ඇතුළු මානසික හෝ ශාරීරික බලහත්කාරය ඇතුළත් නොවේ. සේවකයින්ට සහය සෙවීමේ නිදහස සහ විනය තීරණ අභියාචනය කිරීමේ නිදහස ඇත.

**උසස් (ADVANCED)**

G 4.11 තාවකාලික සේවය භාවිතා කෙරෙන්නේ, සේවය දෛනික ස්වභාවයෙන් යුක්ත නොවන අවස්ථාවන්හි දී පමණි.

G 4.12 සේවයෙන් පහ කිරීමේ දී , සේවකයින්ට රැකියාව සමාප්ත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින 10කට පෙර නොතීසි කාලයක් පිරිනමනු ලැබේ.

## සමානාත්මතාවය, විවිධත්වය සහ අන්තර්ගතය

**මූලික (BASIC)**

G 4.13 සේවකයින් ශාරීරික හෝ මානසික කුමනාකාරයකින් හෝ වෙනස්කොට සලකනු ලැබීමෙන්, ප්‍රචණ්ඩත්වයෙන් හෝ හිංසනයෙන් නිදහස් වේ.

**උසස් (ADVANCED)**

G 4.14 සමානාත්මතාවය, විවිධත්වය සහ අන්තර්ගතය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවා අභ්‍යන්තර වශයෙන් සන්නිවේදනය කරනු ලැබේ.

**අනර්ඝ (EXCELLENT)**

G 4.15 ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව තිබෙන වැටුප් පරතර ඇගයීමට ලක්කර ඒවා ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.

G 4.16 කළමනාකරණ තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමබරතාවය සාක්ෂාත් කරනු ලබයි.

# 5 සේවකයින්ට විවේක කාල, වගකීමෙන් යුතු ගෙවීම් සහ නිපුණතාවය සංවර්ධනය කර ගැනීමට අවස්ථා ඇත

***සේවා හෝරා සහ විවේක කාලය***

**කළ යුතු (MUST)**

G 5.1 සියලු සේවකයින්ගේ අතිකාල සේවය ඇතුළු සේවා හෝරා, ලේඛන ගත කිරීම සඳහා විශ්වසනීය ක්‍රමයක් පවත්වා ගෙන යනු ලැබේ.

**මූලික (BASIC)**

G 5.2 සේවා කාලය අතිකාල සේවා කාලය ද ඇතුළු ව, සතියකට පැය 60 නොඉක්මවයි.

G 5.3 සේවක නියෝජනය හරහා ලිඛිතව එකඟ වී නොමැති නම් හැර, සේවකයින්ට සෑම පැය 4.5ක සේවා කාලයකින් පසුව මිනිත්තු 30ක විවේකයක් අවම වශයෙන් එක් වතාවක් හෝ තිබේ.

G 5.4 දින 6ක සේවයෙන් පසු සේවකයින්ට අවම වශයෙන් එක දිගට පැය 24ක විවේකයක් ඇත.

**උසස් (ADVANCED)**

G 5.5 අදාළ ව්‍යවස්ථා සම්පාදනය මඟින් අර්ථදක්වා ඇති කරුණු වලට අමතරව විශේෂිත පෞද්ගලික කරුණු සඳහා සේවයෙන් බැහැර කාලයක් ලබා ගැනීමේ අවස්ථාව සේවකයින්ට ඇත.

G 5.6 දෛනික සේවා කාලය සතියකට පැය 48 නොඉක්මවයි. අතිකාල සේවා කාලයසතියකට පැය 12 නොඉක්මවයි.

**අනර්ඝ (EXCELLENT)**

G 5.7 අතිකාල සේවය මත රඳා පැවතීමට සිදු නොවන පරිදි වැඩ සැලසුම් කර ඇත.

## වැටුප් සහ ප්‍රතිලාභ

කළ යුතු (MUST)

G 5.8 සේවකයින්ට අවම වශයෙන් නෛතික වශයෙන් අවම වැටුප හෝ ගෙවනු ලැබේ.

මූලික (BASIC)

G 5.9 සේවකයින්ට ඔවුන්ගේ පදනම් ප්‍රදේශයෙන් බැහැරව සේවය කිරීම හේතුවෙන් හට ගන්නා අමතරජීවන වියදම් වෙනුවෙන් වන්දි ගෙවනු ලැබේ

G 5.10 වැටුප් ගෙවනු ලබන්නේ ගිවිසුම්ගත කොන්දේසි වලට අනුව නියමිත කාලයට වන අතර අවම වශයෙන් මාසිකව ය.

G 5.11 සේවකයින්ට ලද වැටුප පිළිබිඹු කෙරෙන, සම්පූර්ණ වැටුප, ප්‍රතිලාභ සහ වැටුප් අඩුකිරීම් තොරතුරු සහිත වැටුප් පත්‍රයක් ලැබේ. වැටුප් පත්‍ර තුළ සපයා ඇති තොරතුරු සේවකයින්ට අවබෝධ කරගත හැකිය.

G 5.12 නිල ඇඳුම් අවශ්‍ය වූ විට, ප්‍රමාණවත් සංඛ්‍යාවෙන් සහ අය කිරීමකින් තොරව ලබා දෙනු ලැබේ. නිල ඇඳුම් පිරිසිදු කිරීම සහ/හෝ නඩත්තු කිරීම සඳහා වැටුපෙන් අඩු කර ගැනීම් සිදු නොකෙරේ.

උසස් (ADVANCED)

G 5.13 අතිකාල පැය ගණන් අධිමිල අනුපාතයක් හෝ ඒ හා සමාන විවේක කාලයක් හරහා හානි පූරණය කරනු ලැබේ.

## නිපුණතා සංවර්ධනය

මූලික (BASIC)

G 5.14 සේවකයින් හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ නිපුණත්වය හිමි අතර තම කාර්යභාරය ඉටු කිරීමට පෙර ඔවුන්ගේ තනතුර හා බැඳී පවතින අවදානම් පිළිබඳ දැනුවත් ය.

G 5.15 සේවකයින්ට තම කාර්යභාරය ඉටු කිරීමට හැකියාව ලබා දෙන පුහුණුවක් හෝ වෙනත් නිපුණතා සංවර්ධන ක්‍රියාකාරකම් ලැබේ.

G 5.16 වයස අවුරුදු 18ට වැඩි වෘත්තීය අභ්‍යාසලාභීන්ට පුහුණුව අතරතුර ඉටු කරන සේවය වෙනුවෙන් වන්දියක් ලැබේ. පුහුණුව ඔවුන්ගේ අධ්‍යාපනයට සම්බන්ධ වේ.

උසස් (ADVANCED)

G 5.17 වෘත්තීය පුහුණු අවස්ථා හඳුනාගෙන ප්‍රවර්ධනය කරනු ලැබේ.

G 5.18 සේවකයින්ට තම වර්තමාන සේවා ක්ෂේත්‍රයට අදාළ හෝ අදාළ නැති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් තම නිපුණත්වය සංවර්ධනය කර ගැනීමට අවස්ථාව ඇත.

# 6 සේවකයාගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරැකේ

**වෘත්තීය සෞඛ්‍යය සහ සුරක්ෂිතතාවය කළමනාකරණය**

කළ යුතු (MUST)

G 6.1 දරුණු වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිත උවදුරු වලට සේවකයින් නිරාවරණය නොවේ. මාරක සිද්ධි වහාම IKEA(අයිකියා) වෙත වාර්තා කෙරේ.

G 6.2 සියලු සේවකයින්ට අනතුරු රක්ෂණ සපයනු ලැබේ. රැකියාව සම්බන්ධ තුවාල සහ රෝග සඳහා වෛද්‍ය ප්‍රතිකාර රක්ෂණය මඟින් ආවරණය කෙරෙන අතර ස්ථිර ආබාධිතාවය හෝ මරණය සිදුවන රැකියාව සම්බන්ධ තුවාල සහ රෝග වෙනුවෙන් වන්දි ගෙවීම සිදුකරයි.

මූලික (BASIC)

G 6.3 වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය සම්බන්ධ අවදානම්, මානසික සෞඛ්‍ය සහ ශ්‍රමක්ෂමතාවය හා සම්බන්ධ ඒවාද ඇතුළුව ඇගයීමට ලක් කර ඒවා අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.

G 6.4 උවදුරු සහිත වැඩ ආශ්‍රිත අවදානම් අවම කර ගැනීමට ආරක්ෂිතව වැඩ කළ හැකි චර්යා රටා ක්‍රියාවට නංවා ඇත.

G 6.5 උපකරණ ආරක්ෂිත වන අතර ආරක්ෂිත තත්ත්ව යටතේ භාවිතා කරනු ලැබේ. අනතුරු ඇඟවීමේ සංඥා සහ ආරක්ෂක තොරතුරු දෘශ්‍යමාන වේ.

G 6.6 සේවකයින් හඳුනාගත් අවදානම් සඳහා *සුදුසු සහ ක්‍රියාකාරී මට්ටමේ පවතින, පිරිසිදු, අයකිරීමකින් තොරව ලබාදෙන පුද්ගල ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් භාවිතා කරයි.

G 6.7 වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතාවය හා සම්බන්ධ අනතුරු සහ ආසන්න අනතුරුවාර්තා කර, විශ්ලේෂණය කර,සොයා බලා, ක්‍රියාමාර්ග ගනු ලැබේ. අනතුරුවල සහආසන්න අනතුරු වලවල වාර්තා නඩත්තු කෙරේ.

G 6.8 සුරක්ෂිතතා උවදුරු අඛණ්ඩව වාර්තා කර, විශ්ලේෂණය කර, සොයා බලා, ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## හදිසි අවස්ථා කළමනාකරණය

මූලික (BASIC)

G 6.9 හදිසි අවස්ථා වල අවදානම් ඇගයීමට ලක් වේ. ලිඛිත හදිසි අවස්ථාපිළිවෙත්ක්‍රියාවට නංවා ඇත.

G 6.10 ස්වාධීන ඉවත් කිරීමේ අනතුරු ඇඟවීම් සංඥාවක් සියලුසේවකයින්ට ඇසෙන සහ/හෝ පෙනෙන සේ ඇත. අනතුරු ඇඟවීමේ සංඥා අතින් ක්‍රියාත්මක කළ හැකි අතර අනතුරු ඇඟවීමේ සංඥා පැහැදිලිව පෙනෙන පරිදි ලකුණු කර ඇත.

G 6.11 හදිසි ඉවත් කිරීමේ මාර්ග සහ පිටවීමේ දොරටු සෑම අවස්ථාවක දී ම ඉක්මන් සහ ආරක්ෂිත ඉවත්වීමක් තහවුරු කරයි.

G 6.12 සේවකයින්ව ප්‍රථමාධාර ලබා දීම සම්බන්ධයෙන් පුහුණු කරනු ලබා ඇති අතර සියලු මෙහෙයුම් කාල තුළ වෘත්තීය අවදානම් වලට ගැළපෙන ප්‍රමාණවත් සංඛ්‍යවකින් ගිනි නිවීමේ උපකරණ ඇත.

G 6.13 ප්‍රථමාධාර සහ ගිනි නිවීමේ උපකරණ වෘත්තීය අවදානම් සඳහා ගැළපෙන වර්ගයෙන්, ප්‍රමාණයෙන් සහ පිහිටුමෙන් යුක්ත වේ. උපකරණ සෑම විටම ක්‍රියාකාරී මට්ටමේ පවතී.

G 6.14 ඉවත්කිරීමේ ක්‍රියාවලිය පරීක්ෂා කර බැලීමට ඉවත්කිරීමේ පෙරහුරු සරඹ ක්‍රියාත්මක කෙරෙන අතර වැඩිදියුණුව සඳහා ඉටුවිය යුතු අවශ්‍යතා හඳුනාගනියි. පෙරහුරු සරඹ සිදුකෙරෙන වාර ගණන අර්ථදැක්වෙන්නේ වෘත්තීය අවදානම් අනුව ය. පෙරහුරු සරඹ සඳහා ඕනෑ තරම්සේවක පිරිසකට සහභාගී විය හැකිය. ඉවත්කිරීමේ පෙරහුරු සරඹ වල වාර්තා පවත්වා ගැනේ.

උසස් (ADVANCED)

G 6.15 හදිසි අවස්ථා පිළිවෙත් පරීක්ෂා කිරීමට සහ වැඩිදියුණුව සඳහා අවශ්‍යතා හඳුනාගැනීමට පෙරහුරු සරඹ ක්‍රියාත්මක වේ. හදිසි අවස්ථා පෙරහුරු සරඹ වල වාර්තා පවත්වා ගැනේ.

G 6.16 හදිසි අවස්ථාවන්හි දී තීරණ ගැනීම සඳහාහදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දක්වන කණ්ඩායමක් පත් කර තිබේ.

අනර්ඝ (EXCELLENT)

G 6.17 ලිඛිත හදිසි අවස්ථා පිළිවෙත් අසල්වැසි සමාගම් සහ ප්‍රාදේශීය අධිකාරීන් සමඟ එක්ව පෙළගස්වා ඇත.

## රසායනික ද්‍රව්‍ය කළමනාකරණය

මූලික (BASIC)

G 6.18 රසායනික ද්‍රව්‍ය මිලට ගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය, හැසිරවීම සහ භාවිතය සේවකයින්ගේසහ පරිසරයේ සෞඛ්‍යය සහ සුරක්ෂිතතාවය ආරක්ෂා වන අයුරකින් සිදු කෙරේ.

උසස් (ADVANCED)

G 6.19 එක්සත් ජාතීන්ගේ ගෝලීය සුසංගත ක්‍රමයට අනුකූලව රසායනික අවදානම් ඇගයීමට ලක් කර ඒ අනුව ලේබල් ගත කිරීම සිදු කෙරේ.

අනර්ඝ (EXCELLENT)

G 6.20 සේවකයිගේ සහ පරිසරයේ සෞඛ්‍යයට සහ සුරක්ෂිතතාවයට අඩු අවදානම් සහිත විකල්ප රසායන ද්‍රව්‍ය හඳුනාගෙන භාවිතා කෙරේ.

## ගොඩනැගිලි සහ විදුලි බල සුරක්ෂිතභාවය

මූලික (BASIC)

G 6.21 ගොඩනැගිලි සැලසුම් නිර්මාණය, ගොඩනැඟීම, නඩත්තු කිරීම සහ නවීකරණය කිරීම සිදු කරන්නේ ව්‍යුහාත්මක සම්පූර්ණත්වය තහවුරු වන පරිදි ය.

G 6.22 විදුලි රැහැන් ඇදීම, ආලෝකකරණය සහ වායු සවිකුරු මැනවින් සවිකර පවත්වා ගැනේ.

## වෘත්තීය සෞඛ්‍ය පරීක්ෂා සහ සෞඛ්‍ය සුරැකුම් සහාය

**මූලික (BASIC)**

G 6.23 ගැබ්ගැනීම හෝ එච්.අයි.වී. සඳහා වැනි රැකියාවට සම්බන්ධ නොවන සෞඛ්‍ය පරීක්ෂා යොදා නොගැනේ.

**උසස් (ADVANCED)**

G 6.24 රැකියාව හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය බලපෑම් හඳුනාගැනීම සඳහා සේවකයින්ට නිතිපතා වෘත්තීය සෞඛ්‍ය පරීක්ෂා පිරිනමනු ලැබේ. සෞඛ්‍ය පරීක්ෂා සිදුකරනු ලබන්නේ සෞඛ්‍ය සුරැකුම් වෘත්තිකයෙකු විසිනි. සොයාගැනීම් රහසිගතව පවත්වා ගැනෙන අතර රැකියා ස්ථානගතකිරීම හෝ රැකියා ස්ථානය වෙත සිදුකළ හැකි හැඩ ගැස්වීම් පිළිබඳ නිර්දේශ නිකුත් කිරීම සඳහා සෞඛ්‍ය සුරැකුම් වෘත්තිකයා විසින් ඒවා යොදා ගනු ඇත.

**අනර්ඝ (EXCELLENT)**

G 6.25 සේවකයින්ට අදාළ ව්‍යවස්ථා සම්පාදනය විසින් අර්ථදක්වා ඇති දෙයට අමතරව, සෞඛ්‍ය සුරැකුම් උපකාරය ලැබේ.



# 7 සේවා සහ ජීවන තත්ත්ව යෝග්‍ය වේ

### රැකියා තත්ත්ව

| | මූලික (BASIC) | |
|---|---|---|

G 7.1 රැකියා කිරීමේ පරිසරය පිරිසිදු, සනීපාරක්ෂිත සහ මැනවින් නඩත්තු කෙරෙන ස්ථානයක් වන අතර ප්‍රමාණවත් ආලෝකය, වාතාශ්‍රය සහ අවශ්‍ය වූ විට තාපන පහසුකම් පවතියි.

G 7.2 සේවකයින්ට ආහාර ගත හැකි සහ විවේක ගත හැකි ස්ථාන උවදුරුවලින් ඈත්ව පිහිටා ඇති අතර ඒවාසේවකයින්ගණනට සමානුපාතික වේ.

G 7.3 වැසිකිළි ගාස්තු අයකිරීමකින් තොරව ලැබෙන අතර ඒවා සනීපාරක්ෂිත, සේවා කාල අතර තුර පිවිසිය හැකි, මූලික සැපයුම් වලින් සමන්විත වූ ඒවා වන අතර සේවකයින්ගණනට සමානුපාතික වේ.

G 7.4 සීමාවකින් තොරව, පිරිසිදු පානීය කිරීමේ ජලය අය කිරීමකින් තොරව සහ වැඩ කරන ප්‍රදේශයට සාධාරණ දුරකින් පිහිටා ඇත.

# 8 ලෝකය ආරක්ෂා කරනු ලැබේ

## පාරිසරික බලපෑම්

**කළ යුතු (MUST)**

G 8.1 දරුණු පරිසර දූෂණයක් සිදු නොවේ. දරුණු පරිසර දූෂණයක් වේ නම් එය වහාම IKEA(අයිකියා) වෙත වාර්තා කෙරෙනු ලැබේ.

**මූලික (BASIC)**

G 8.2 පාරිසරික පැමිණිලි පටිගත කර ක්‍රියාමාර්ග ගනු ලැබේ.

G 8.3 වර්තමාන හෝ පෙර ක්‍රියාකාරකම් හේතුවෙන් භූමිය අපවිත්‍රණය වීමේ අවදානම ඇගයීමට ලක් කර ක්‍රියාමාර්ග ගනු ලැබේ.

G 8.4 පාරිසරික කාර්යසාධනය වැඩි දියුණු කර ගැනීමට මාර්ග සොයා ගැනීම පිණිස පාරිසරික අවදානම් සහ බලපෑම් හඳුනාගෙන ඇගයීමට ලක් කරනු ලැබේ. සෑම මාස 12කට වරක් ම පරිසර සංවර්ධන සැලසුම් දියත් කිරීම, විමර්ශනය කිරීම සහ යාවත් කාලීන කිරීම සිදු කෙරේ.

**උසස් (ADVANCED)**

G 8.5 මෙහෙයුම් සහ ව්‍යුහාත්මක වෙනස්කම් නිශ්චය කිරීමේ දී පාරිසරික බලපෑම් තක්සේරු කෙරේ.

## වායු දූෂණය සහ දේශගුණය

**මූලික (BASIC)**

G 8.6 වර්තමාන බලශක්ති මූලාශ්‍ර දැනගෙන ප්‍රතිනව්‍යකරණ බලශක්ති මූලාශ්‍ර වලට පරිවර්තනය කිරීමට ඇති හැකියාවන් හඳුනාගැනේ.

**උසස් (ADVANCED)**

G 8.7 ජනනය කර හෝ මිලට ගෙන පරිභෝජනයට ගන්නා සියලු විදුලිබලය නව්‍යකරණ බලශක්ති මූලාශ්‍ර වෙතින් පැමිණෙයි.

G 8.8 ඕසෝන් ප්‍රමාණය අඩු කරන ද්‍රව්‍ය හෝ හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන් භාවිතා නොකෙරේ.

G 8.9 ප්‍රධාන බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් පොසිල ගල් අඟුරු හෝ තෙල් මූලික වූ ඉන්ධන සේවා පිහිටුම් ස්ථාන වල භාවිතා නොකෙරේ.

**අනර්ඝ (EXCELLENT)**

G 8.10 වායු දූෂක සහ හරිතාගාර වායු විමෝචනය, (පැරිස් ගිවිසුමේ නියම කරන ලද පරිදි) ශතවර්ෂය අවසානය වන විට ගෝලීය උෂ්ණත්වය වැඩිවීම සෙල්සියස් අංශක 2 ට වඩා අඩු මට්ටමකට සීමා කිරීමට අනුගත ව, සෙල්සියස් අංශක 1.5 වෙත ඉලක්ක කරමින්, ස්ථිර වශයෙන් අඩු කරනු ලබා ඇත.

G 8.11 ජනනය කර හෝ මිලට ගෙන පරිභෝජනයට ගන්නා සියලු බලශක්තිය නව්‍යකරණ බලශක්ති මූලාශ්‍ර වෙතින් පැමිණෙයි.

## සංරක්ෂණය සහ ජෛව විවිධත්වය

**මූලික (BASIC)**

G 8.12 IKEA(අයිකියා) මඟින් පිළිගත් ක්‍රමයකට අනුකූලව සහතික කරන ලද ප්‍රදේශයක් නොවේ නම් අධි සංරක්ෂණ අගයකින් යුතු ප්‍රදේශ වල ව්‍යාපාර කටයුතු සිදු නොකෙරේ.

**උසස් (ADVANCED)**

G 8.13 ජෛව විවිධත්වයට සහයෝගය දැක්වීමට මුල් පිරීම් දියත් කෙරේ.



# 9 ජලය සහ අපද්‍රව්‍ය ඇතුළු සම්පත්, තිරසර සහ වක්‍රීය ආකාරයකින් කළමනාකරණය කරනු ලැබේ.

**ජලය**

**මූලික (BASIC)**

G 9.1 කුමන ආකාරයකින් ඇතුළට එන ජලය පරිහරණය කරන්නේ ද සහ අප ජලය හසුරුවනු ලබන්නේ කෙසේද, කොහේද සහ කවුරුන් විසින් ද යන තොරතුරු ලබා ගත හැකිය.

**උසස් (ADVANCED)**

G 9.2 මෙහෙයුම් තුළ ජලය භාවිතා කරනු ලබන්නේ නම්, ජලය භාවිතය සහ මුදා හැරීම අඩු කළ හැකි අවස්ථා හඳුනාගෙන ක්‍රියාවට නැංවේ.

**අනර්ඝ (EXCELLENT)**

G 9.3 මෙහෙයුම් තුළ ජලය භාවිතා කරන්නේ නම්, උසස් තත්ත්වයේ ජලය පරිහරණය සීමා කිරීමට ඇති විභවතා හඳුනා ගැනේ. අභිවෘද්ධියට හේතු වෙමින්,උසස් තත්ත්වයේ ජලය,පරිහරණය සීමා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ.

## අපද්‍රව්‍ය කළමනාකරණය

**මූලික (BASIC)**

G 9.4 සේවකයින්ගේ සහ පරිසරයේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාවය ආරක්ෂාවන පරිදි අපද්‍රව්‍ය ගබඩා කිරීම, හැසිරවීම, ප්‍රවාහනය සහ බැහැර කිරීම සිදු වේ. කිසිදු අපද්‍රව්‍යයක් පිහිටුම් භූමිය ගොඩ කිරීම සඳහා යොදා නොගැනේ. උවදුරු සහිත සහ උවදුරු රහිත අපද්‍රව්‍ය වෙන් වෙන්ව පවත්වා ගැනේ.

G 9.5 බල ශක්තිය ප්‍රකෘතිමත් කිරීමේ අරමුණ සඳහා හැර පිහිටුම් භූමිය තුළ අපද්‍රව්‍ය පුළුස්සනු නොලැබේ.

G 9.6 අපද්‍රව්‍ය හසුරුවනු ලබන්නේ කෙසේද, කොහේද, කොපමණ ප්‍රමාණයක් ද සහ කවුරුන් විසින් ද යන කරුණු පිළිබඳ වාර්තා ඇත.

G 9.7 අපද්‍රව්‍ය ඉවත දැමීමට, අඩු කිරීමට සහ ප්‍රතිචක්‍රීයකරණය කිරීමට ඇති අවස්ථා හඳුනාගෙන ක්‍රියාවට නැංවේ.

**උසස් (ADVANCED)**

G 9.8 බිම් ගොඩ කිරීම සඳහා කිසිදු අපද්‍රව්‍යයක් යොමු නොකෙරේ.

**අනර්ඝ (EXCELLENT)**

G 9.9 සියලු අපද්‍රව්‍ය නැවත භාවිතා කෙරේ, නැතහොත් ප්‍රතිචක්‍රීයකරණය කෙරේ.



# ශබ්දමාලාව

***අනතුර***

තුවාල, ලෙඩ හෝ මරණය ඇති කරන අනපේක්ෂිත සහ සිතාමතා නොකරන සිදුවීමක් හෝ සිද්ධියක්.

***පදනම් ස්ථානය***

සේවානියුක්ති ගිවිසුමේ අර්ථදක්වා ඇති ස්ථානය. මෙය ගිවිසුම හරහා සම්බන්ධ කර තබෙන නියමිත සේවාස්ථානය හෝ කාර්යාලය වේ.

***ව්‍යාපාර ආචාරධර්ම***

ව්‍යාපාර කිරීමේදී සදාචාරමය වශයෙන් නිවැරදි දේ සහ වැරදි දේ තීරණය කිරීම සඳහා පවතින නීති, ප්‍රතිපත්ති, සහ ප්‍රමිති.

***ළමයි***

දරුවාට, අදාළ නීතිය යටතේ පෙරාතුව සම්පූර්ණ වයසට පත් වී තිබේ නම් හැර, වයස අවුරුදු 18ට අඩු පුද්ගලයින්.

***ළමා ශ්‍රමය***

තම ළමාකාලය, විභවතාවය සහ ගරුත්වය අහිමි කරන සහ තම ශාරීරික සහ මානසික සංවර්ධනයට හානිකරන අයුරින් වැඩ කිරීමේ අවම වයසට අඩු වයසේ ළමයින් විසින් සිදුකරන ලද වැඩ. එපමණක් නොව, වැඩ සිදුකළ ආකාරය සහ පැය ගණන සහ එය සිදුකළ වතාවරණ මත පදනම් ව, වයස අවුරුදු 18ට අඩු ඕනෑම පුද්ගලයෙකු විසින් සිදුකරන ලද වැඩ "*ළමා ශ්‍රමය*" ලෙස ද සැලකිය හැකිය.

***සාමූහික කේවල් කිරීම***

සේවා යෝජිතයා සහ සේවක නියෝජිතයින් අතර ගිවිස ගැනීම් සේවකයින්විසින් නිදහසේ සහ ස්වාධීනව තෝරාගනු ලබයි.

***වෙනස්කොට සලකනු ලැබීම***

*වෙනස්කොට සලකනු ලැබීම* සිදුවන්නේ තමන්ට රැකියාව කිරීමට ඇති හැකියාවට සම්බන්ධ නොවන පදනමක් මත, සමාන අවස්ථාවක දී පුද්ගලයෙකුට වෙනත් අයෙකුට වඩා අඩු මනාපයකින් යුතුව සලකනු ලබන විට දී ය.

*වෙනස්කොට සලකනු ලැබීමට* පදනම් වන හේතු: රැකියාව ඉටු කිරීමට ඇති හැකියාව හා කිසිදු සම්බන්ධයක් නොදරන, වයස, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය, ලිංගික දිශානතිය, මානසික හෝ ශාරීරික දුබලතාවය, ජනවාර්ගිකත්වය, ජාතිකත්වය, ආගම, විවාහක හෝ පවුලේ තත්ත්වය හෝ පුද්ගලයෙකු ගේ අනන්‍යතාවයේ වෙනත් ඕනෑම මානයක්.

***සේවයෙන් පහ කිරීම***

*සේවකයා* විසින් එකඟ වන ලද හෝ වාද නොකරන ලද හෝ අධිකාරීන් විසින් සනාථකරන ලද විනය ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලයක් වශයෙන් හෝ හැර සේවා යෝජකයා යම් හේතුවක් නිසා යම් අයෙකුට තම රැකියාව නිල වශයෙන් හැර යාමට සලස්වන අවස්ථාව. සේවකයින් ඉවත් කිරීම හෝ අතිරික්ත කර තබන අවස්ථා මෙයට ඇතුළත් වේ.

***විවිධත්වය***

*විවිධත්වයයනුවෙන්* අදහස් වන්නේ, මිනිසුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ සමාජ අනන්‍යතාවය, ලිංගික දිශානතිය, මානසික හෝ ශාරීරික දුබලතාවය, ජනවාර්ගිකත්වය, ජාතිකත්වය, විවාහක හෝ පවුලේ තත්ත්වය හෝ ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබඳ වෙනත් ඕනෑම මානයක් ඇතුළු මිනිසුන් අතර පවතින විවිධ සමානතා සහ විෂමතාවන්ට ය.

***හදිසි පිටවීම***

හදිසි පිටවීමක් ආලෝකමත් කර හෝ ප්‍රභාසම්පන්න පින්තූර සහිත සංඥාවකින් දක්වනු ලැබේ. පිටවීම බාහිර දෙසට විවෘත වන, අගුළු නොදමා තිබෙන සහ සැම විටම බාධක රහිත වූවකි.

***හදිසි අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම***

හදිසි අවස්ථා ප්‍රතිචාරයට සමායෝජනය වීමට සුදුසු නිපුණතාවය සහිත සේවකයින්කණ්ඩායමක්: හදිසි අවස්ථාව පිළිබඳ තක්සේරු කිරීම, ක්ෂණික තීරණ ගැනීම, ප්‍රාදේශීය අධිකාරීන් සහ හදිසි සේවා වෙත දක්වන සහයෝගය, සහ බාහිර සහ අභ්‍යන්තර සන්නිවේදනය.

***හදිසි අවස්ථා මාර්ගය***

හදිසි පිටවුමක්වෙත යොමු කරවන මාර්ගය. මාර්ගය සැම විටම බාධක රහිතව පවත්වා ගනු ලැබේ.

***සමානාත්මතාවය***

*සමානාත්මතාවය* යනුවෙන් අදහස් වන්නේ, පුද්ගලික පසුබිම හෝ විෂමතා නොතකා සියලු දෙනාට සාධාරණව සලකනු ලබන බව සහ සමාන අවස්ථා සපයනු ලබන බව යි. *සමානාත්මතාවය* යන්නෙන් කිසිදු ආකාරයක *වෙනස්කොට සලකනු ලැබීමක්*නොපවතින බව ද ඇඟවේ.

***බල කරන ලද, ඇපයට බැඳුණු හෝ බන්ධනාගාර ශ්‍රමය***

යනු ඕනෑම පුද්ගලයෙකු දඬුවමක් පිළිබඳ බිය ගැන්වීම හෝ තර්ජනය කිරීම යටතේ සිදු කරනු ලබන ඕනෑම වැඩක් හෝ සේවයක් වන අතර එය එම පුද්ගලයා විසින් සිය කැමැත්තෙන් තොරව ඉටුකිරීමට ඉදිරිපත් වූවකි. පුද්ගලික බඩුබාහිරාදිය අපහරණය කිරීම, ඕනෑම මොහොතක සේවා නියුක්තිය සමාප්ත කිරීමට ඇති නොහැකියාව සහ සේවා පරිශ්‍රය හැර යාමට ඇති නොහැකියාව මෙයට ඇතුළත් වේ.

ඇපයට බැඳුණු *ශ්‍රමයයනු* බඳවා ගැනීමේ ගාස්තු හෝ වියදම්, තැන්පතු ගෙවීම, ණය ලබා ගැනීම හෝ වැටුප් අත්තිකාරම් ලබා ගැනීම් වක්‍රව හෝ ඍජුව අය කර ගනු ලැබීමේ හෝ ගෙවීම්කිරීම ප්‍රමාද කර තැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් සේවකයින්තම රැකියාවට ණය බැඳීම හරහා බැඳී සිටීමට සිදුවන බල කරන ලද *ශ්‍රමයේ* ආකාරයකි.

බන්ධනාගාර *ශ්‍රමය* යනු බන්ධනාගාර රැඳවූවන් විසින් සිදුකරනු ලබන වැඩ ය.

***මූලික ශ්‍රම අයිතිවාසිකම්***

IWAY (අයි වේ) අභිමතාර්ථය පිණිස, *මූලික ශ්‍රම අයිතිවාසිකම්* වලට බලකරන ලද සහ ඇපයට බැඳුණු *ශ්‍රමයෙන්* නිදහස, වෙනස්කොට සලකනු නොලැබීම, රැස්වීමේ නිදහස සහ සාමූහික *කේවල් කිරීමේ* අයිතිය ඇතුළත් වේ.

***ස්ත්‍රී පුරුෂ සමාජ භාව සමබරතාවය***
*ස්ත්‍රී පුරුෂ සමාජ භාව සමබරතාවය* යනුවෙන් අදහස් වන්නේ සමාන ගණනින් යුත් පුරුෂයින් සහ ස්ත්‍රීන් ය.

***හරිතාගාර වායු***
කියෝතෝ මුල් ගිවිසුමේ අර්ථදක්වා ඇති *හරිතාගාර වායු* හතෙන් ඕනෑම වායුවක්, කාලගුණ විපර්යාස වලට දායක වන විමෝචන: කාබන් ඩයොක්සයිඩ් ($CO_2$), මීතේන් ($CH_4$), නයිට්‍රස් ඔක්සයිඩ් ($N_2O$), සල්ෆර් හෙක්සාෆ්ලෝරයිඩ් ($SF_6$), *හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන්* (HFCs), නයිට්‍රොජන් ට්‍රයිෆ්ලෝරයිඩ් ($NF_3$), සහ පර්ෆ්ලෝරෝකාබන් (PFCs). මේ වායු හරිතාගාරයක් මෙන් සූර්යයා වෙතින් පැමිණෙන තාපය සිර කර රඳවා තබා ගැනීමෙන් ගෝලීය උණුසුමට දායක වේ - මෙනම් හරිතාගාර ආවරණය.

***උවදුර***
ජීවිතයට, සෞඛ්‍යයට හෝ පරිසරයට තර්ජනාත්මක මට්ටමක් ඇති කරන තත්ත්වයක්. මෙයට ශාරීරික, රසායනික, ජීවවිද්‍යාත්මක, ශ්‍රමක්ෂමතා හෝ වෘතීයමය*උවදුරු* ඇතුළත් විය හැකි ය.

***උවදුරු සහිත වැඩ***
සේවකයින් *උවදුරු* වලට නැඹුරු වීමේ ප්‍රවණතාවයක් සහිත වැඩ.

***අධි සංරක්ෂණ වටිනාකමින් යුත් ප්‍රදේශ***
අධි සංරක්ෂණ වටිනාකම් සම්පත් ජාලය මඟින් ජාතික, කලාපීය හෝ ගෝලීය මට්ටමින් කැපී පෙනන ලෙස සුවිශේෂ වූ හෝ තීරණාත්මක ලෙස වැදගත් යැයි අර්ථදැක්වූ ජීවවිද්‍යාත්මක, පරිසරවිද්‍යාත්මක, සමාජයීය හෝ සංස්කෘතික අගයන් සහිත ප්‍රදේශ.

***උසස් තත්වයේ ජලය***
භෞතික, රසායනික සහ ජීවවිද්‍යාත්මක ලක්ෂණ ගැළපෙන හෝ පානීය ජල සීමාවන්ට සමීප ජලය.

***හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන***
*හයිඩ්‍රෝෆ්ලෝරෝකාබන්* (HFCs) යනු මිනිසා විසින් නිර්මාණය කරන ලද, ෆ්ලෝරීයකරණයට ලක් වූ *හරිතාගාර වායු* ය. ඒවා නිරන්තරයෙන් වායු සමීකරණය, ශීතකරණය, පෙණ පිඹීම, ගිනි මන්දක, ද්‍රාවක සහ එයරෝසොල් වල තිබෙන *ඕසෝන් අඩු කරන ද්‍රව්‍ය* සඳහා ප්‍රතිස්ථාපන ලෙස යොදාගනු ලබයි.

***අන්තර්ගතය***
*අන්තර්ගතය* යනුවෙන් අදහස් වන්නේ සාධාරණ, හිතකර සහ ඉහළ ක්‍රියාකාරීත්වයකින් යුත් සංවිධානයක් හෝ ප්‍රජාවක් නිර්මාණය කිරීමට *විවිධත්වය* උත්තෝලනය කිරීමෙන් බලය ලබා දීමයි. ඇතුළු වූ පරිසරයක් සම්පත් සහ අවස්ථා වෙත සියලු දෙනා සඳහා සමාන ප්‍රවේශය තහවුරු කරයි. එමෙන්ම එය පුද්ගලයින් සහ කණ්ඩායම් වලට ඔවුන්ගේ ස්වභාවය සහ සංවිධානමය සහ සමාජමය ඉලක්ක වෙත ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් ආරක්ෂිත බව, ගෞරවය, අනුබද්ධ බව, අභිප්‍රේරිත බව, සහ අගය කරනු ලබන බව හැඟීමට හැකියාව ලබා දෙයි.

***ජීවන වියදම්***
ආහාරපාන, නිවාස සහ ඇඳුම් වැනි ජීවිතයේ මූලික අවශ්‍යතා සමඟ බැඳී පවතින වියදම්.

***අවම නෛතික සේවානියුක්ති වයස***
*අවම නෛතික සේවානියුක්ති වයස* අර්ථදක්වනු ලබන්නේ දේශීය ව්‍යවස්ථාදායකය මඟින් වන අතර එය පුද්ගලයෙකුට සේවයෙහි නියුතු විය හැකි වයස වේ.

***ආසන්න අනතුරු***
ආසන්න අනතුරක් යනු තුවාලයක් හෝ ලෙඩක් ඇති නොවුණු සැලසුම් නොකළ සිදුවීමක්- නමුත් එවැනි දෙයක් වීමට විභවතාවය තිබූවක්. සිදුවීම් ජාලයේ වාසනාසහගත බණ්ඩනයක් තුවාලයක් හෝ ලෙඩක් සෑදීම වැළක්වී ය.

***නොතීසි කාලය***
සමාප්තිය පිළිබඳ නොතිසිය දුන් දිනය සහ සේවය කිරීමේ අවසන් දිනය අවසන් වීම අතර කාලය. *නොතීසි කාලය* තුළ *සේවකයාගේ* ගිවිසුමට අනුකූල වන පරිදි ගෙවීම් කරනු ලැබේ.

***ඕසෝන් අඩු කරන ද්‍රව්‍ය***
ඉහළ වායු ගෝලය තුළ තිබෙන පෘථිවි ආරක්ෂක ඕසෝන් ස්ථරය විනාශ කරන රසායන ද්‍රව්‍ය. ඕසෝන් අඩු කිරීම සඳහා වගකිවයුතු, මිනිසා විසින් නිර්මිත අනෙකුත් ද්‍රව්‍ය අතරින් ක්ලෝරෝෆ්ලෝරෝකාබන් වර්ග (CFCs), හයිඩ්‍රෝක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් වර්ග (HCFCs), සහ හැලෝන් වර්ග ඒවාට ඇතුළත් වේ. *ඕසෝන් අඩු කරන ද්‍රව්‍ය* භාවිතය මොන්ට්‍රියෙල් මුල් ගිවිසුමට අනුකූලව පාලනය කරනු ලැබේ.

***පැරිස් ගිවිසුම***
වර්ෂ 2020 දී ආරම්භ වන, *හරිතාගාර වායු* විමෝචනය අවම කිරීම, අනුවර්තනය වීම, සහ මූල්‍යනය යන කරුණු හසුරුවනු ලබන දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතිය තුළ ගිවිසුම.

***ගෙවීම් පත්‍රය***
සෑම ගෙවීම් කාලයක් අවසානයේ දී ම, හානිපූරණයේ සංරචක පැහැදිලිව දැක්වෙන පරිදි සේවකයෙකුට ලබා දෙන ද්‍රව්‍යමය හෝ ඉලෙක්ට්‍රොනික සටහනක්. වැටුප්, ප්‍රතිලාභ සානුබල/බෝනස් සහ වැටුප් අඩුකිරීම් සඳහා සිදුකළ නියම ප්‍රමාණ මෙයට ඇතුළත් වේ.

***නව්‍යකරණ බලශක්තිය***
මිනිස් කාල පරිමාණයක් තුල ස්වභාවිකව අභාවයට යන පොසිල නොවන නව්‍යකරණ බලශක්ති මූලාශ්‍ර වලින් ලබා ගන්නා සියලු බලශක්ති ප්‍රභව. *නව්‍යකරණ බලශක්තියට* පහත දැක්වෙන බලශක්ති මූලාශ්‍ර ඇතුළත් වේ: සුළඟ, සූර්ය, ජල බලය, ජීව වායු, ජල තාපන සහ සාගර (තරංග සහ උදම්) සහ භූ තාපන බලශක්තිය. න්‍යෂ්ටික බලශක්තිය සහ පොසිල ඉන්ධන එයට ඇතුළත් නොවේ.

***චර්යා පිළිවෙත්***
කාර්යක් සාධනය කරගැනීම සඳහා නිර්මාණය කරන ලද ක්‍රියාමාර්ග රැසක්. විශේෂයෙන් දක්වා නැත්නම්, *චර්යා පිළිවෙත්* අලිඛිත විය හැකිය.

***දරුණු පාරිසරික දූෂණය***
ආපසු හැරවිය නොහැකි, දිගු කාලීන හෝ පුළුල්ව්‍යාප්ත පරිසර පද්ධති භේදනයක් හෝ පිහිටුම් ස්ථානයෙන් පුළුල්ව පැතිරීමට හැකියාවක් සහිත පරිසර දූෂණය.

***දරුණු වෘත්තීයමය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා උවදුරු***

මරණය, ස්ථිර තුවාල හෝ රෝග ඇති කළ හැකි ක්ෂණික සහ සුරක්ෂිතතා උවදුරු හෝ සෞඛ්‍ය සහ සුරක්ෂිතතා උවදුරු ඇති කිරීමේ හැකියාවක් සහිත වූ උවදුරු.

***උප ගිවිසුම්කරු***

IKEA (අයිකියා) *අගය දාමයේ* කොටසක් ලෙස නිෂ්පාදන,සේවා,අමුද්‍රව්‍ය හෝ සංරචක සපයන ඕනෑම පුද්ගලයෙක් හෝ අස්තිත්වයක්.

***සැපයුම්කරු***

IKEA(අයිකියා) සමාගම සමඟ නිෂ්පාදන, සේවා, අමුද්‍රව්‍ය හෝ සංරචක සැපයීමට ගිවිසුමක් සහිත සමාගමක් හෝ සංවිධානයක් මෙන්ම, එම ගිවිසුමට උප කොන්ත්‍රාත්කරුවන් වන ඕනෑම අයෙක්. මෙම ලේඛනයේ අරමුණ සඳහා,සැපයුම්කරු යන පදයසැපයුම්කරුවන්ට සේවා සපයන්නන්ට සහ වෙනත් කොන්ත්‍රාත් පාර්ශව වලට ද අදාළ වේ.

***තාවකාලික සේවය***

සීමිත කල් පැවැත්මක් සහිත සේවය. ගිවිසුමේ අවසානය නිර්ණය කරනු ලබන්නේ විෂයබද්ධ තත්ත්ව මඟිනි, උදා: විශේෂිත දවසක්, විශේෂිත කාර්යයක් සම්පූර්ණ කිරීම, හෝ විශේෂිත සිද්ධියක් සිදුවීම. *තාවකාලික සේවය* පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන විය හැකි අතර එය ද්වී පාර්ශවික (පාර්ශව දෙකක් අතර) හෝ ත්‍රෛ පාර්ශවික (පාර්ශව තුනක් අතර) විය හැකි ය.

***අගය දාමය***

නිෂ්පාදනයක් හෝ සේවයක් එහි සංකල්පනාවේ සිට අවසන් පාරිභෝගිකයා වෙත ගෙන ඒම සහ එය *අගය දාමය* තුළට නැවත සමෝධායනය කිරීම දක්වා අවශ්‍යකරන ක්‍රියාකාරකම් වල සමස්ත පරාසය. පාරිභෝගිකයා සඳහා සැලසුම් නිර්මාණය, නිෂ්පාදනය, බෙදාහැරීම, සහ සහයෝගය දැක්වීම වැනි ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ. *අගය දාමයේ* විවිධ අදියර වල දී, අවසන් වටිනාකම ඉහළ දැමීම සඳහා පරදු දරන්නන් නිෂ්පාදනයට හෝ සේවාවට අගයක් එකතු කරයි.

***වෘත්තීය පුහුණුව***

අධ්‍යයන අරමුණක් සහිත සියලු ආකාරයේ ආධුනිකත්ව පුහුණු, සමාරෝධන සහ රැකියා අත්දැකීම් මෙයට ඇතුළත් වේ. *වෘත්තීය පුහුණුව* වෘත්තියක් හෝ පුහුණු මාර්ගයක් පිළිබඳ අභ්‍යාසලාභියාගේ තෝරාගැනීම සඳහා සහයෝගය දැක්වීමට නිර්මාණය කෙරුණු දිශාභිමුඛ වැඩසටහනක් හෝ මාර්ගෝපදේශනයක් ලෙස කටයුතු කරන හෝ, සුදුසු අධිකාරියක් විසින් පුහුණු වැඩසටහනක් ලෙස අනුමත කරන ලද හෝ ප්‍රාදේශීය පාසලක් හෝ පුහුණු ආයතනයක් සමඟ සහයෝගයෙන් යුතුව හසුරුවනු ලැබේ.

***සේවකයා***

පූර්ණකාලීනව හෝ අර්ධ කාලීනව සේවය ලබාදීම සිදුකරන පුද්ගලයෙක්. මෙයට කුලී ගෙවීම් ලබන සේවකයින්, *වෘත්තීය පුහුණුව* ලබන්නන් සහ පරිවාස කාලයක් යටතේ සේවය කරන සේවකයින්, මෙන්ම වැඩ බිමෙහි සතියට පැය (18) හෝ ඊට වැඩිය සේවය සපයන උප-කොන්ත්‍රාත් සේවකයින් ඇතුළත් වේ.

***සේවා හෝරා***

සේවකයෙකුවැඩ කරන කාල පරාසය. ඒවා වැටුප් ගෙවනු ලැබුව ද, වැටුප් සහිත වාර්ෂික නිවාඩු, වැටුප් සහිත මහජන නිවාඩු, වැටුප් සහිත ලෙඩ නිවාඩු, ආහාර වේල් සඳහා විවේක කාලය, නිවසේ සිට රැකියා ස්ථානය වෙත ගමන් කිරීමේ දී සහ ආපසු නිවසට යාමේ දී ගත කළ කාලය වැනි වැඩ නොකළ කාලය බැහැර කරයි.

***යොවුන් සේවකයා***

අවුරුදු 18ට අඩු, නමුත් රැකියා කරන වයසට අදාළ අවම නෛතික වයසට වඩා වැඩි රැකියාවේ නියුතු පුද්ගලයින්.

***ශුන්‍ය හෝරා ගිවිසුම***

*සේවකයා* වෙත දෛනික වැඩ පැවරීමට සේවා යෝජකයාට අනුබල නොදෙන, නමුත් වැඩ පවතින අවස්ථාවන්හි *සේවකයා*සේවයට වාර්තා කිරීම අවශ්‍ය වන සේවා නියුක්ති ගිවිසුමක්.



<නැවතත් පටුන වෙත

**6.0 සංස්කරණය 2019 සැප්තැම්බර් ප්‍රකාශිත - © Inter IKEA Systems B.V. 2019 (ඉන්ටර් අයිකියා සිස්ටම්ස් බී.වී.2019)**